**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව 2010**

------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ශේෂ පත්‍ර මුහුණතෙහි ජංගම වත්කම් ලෙස ඉදිරිපත් කළ යුතු වටිනාකම රු. 173,452,035 ක් වූ කෙටිකාලීන අයෝජන, ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කර තිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙළඳ ණයහිමියෝ යටතේ දක්වා ඇති අමතර කොටස් මිලදී ගැනීම් සඳහා වූ වෙන්කිරීම් ගිණුමේ වටිනාකම රු.219,549 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් අඩුපාඩු විය.

i. සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවන ලද ආදායම් බද්ද ලෙස රු. 62,571,066 ක මුදලක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණද තථ්‍ය ගෙවීම රු. 62,381,313 ක් විය.

ii. කෙටිකාලීන ආයෝජන සඳහා වර්ෂය තුල කරන ලද රු. 3,473,008,635 ක ආයෝජන වටිනාකම සහ වර්ෂය තුල නිදහස් කර ගන්නා ලද රු. 3,431,273,592 ක ආයෝජන වටිනාකම වෙන් වෙන්ව දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ගෙවිය යුතු රු.3,608,104ක ආර්ථික සේවා ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව නොදක්වා ණය හිමි සාමාන්‍ය (Creditor Control General) වටිනාකම තුල ඇතුලත් කර තිබුණි.

(ඈ) රු.224,212 ක කල් ඉකුත්වූ ඖෂධ දෙකක වටිනාකම ලාභයෙන් කපාහරිනු වෙනුවට විකුණුම් පිරිවැය යටතේ දක්වා තිබීමෙන් විකුණු බඩුවල පිරිවැය අධිගණනය වී තිබුණි.

1.2.3 **ලැබිය යුතු ගිණුම්**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගෙන් හා ඖෂධ අලෙවි කරන්නන්ගෙන් ලැබිය යුතු පිළිවෙලින් රු. 880,332 ක හා රු. 64,487 ක මුදලක් වසර 07 ක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අයවී නොතිබුණි.

1.2.4 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

රු.5,748,845 ක් වටිනා බදු ඉඩම වෙනුවෙන් වූ ඔප්පුව හෝ බදුකරය, අංක CAWRI 1009/2007 දරණ නඩුකරයට අදාල ලිපිගොනුව, වටිනාකම රු.13,700,573 ක ගැලපුම් ගිණුම් වලට අදාල තොරතුරු සහ ජර්නල් වවුචර් යනාදිය ඉදිරිපත් නොකිරීම නිසා මෙම විෂයයන් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

1.2.5 **නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම්**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවසථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | උපයනවිට ගෙවීම් බදු මුදල සේවකයන්ගෙන් අය කළයුතු වුවද රු.1,279,741 මුදල සංස්ථා අරමුදලින් ගෙවා තිබුණි. |
| (ආ) 2006 ජනවාරි 04 දිනැති අංක CSA/$P_1$/40 දරන ජනාධිපති චක්‍රලේඛය | වාහන හිමිකම් ඇති අනෙකුත් නිලධාරින් වෙනුවෙන් මිලදී ගතහැකි වාහනයක වටිනාකම රු. 2,500,000 ක් වුවද එම ප්‍රමාණය රු.440,000 කින් ඉක්මවා සංස්ථාව රු.2,940,000 ක් වටිනා මයික්‍රෝ වර්ගයේ මෝටර් රථයක් මිලදී ගෙන තිබුණි. |
| (ඇ) 2009 ජුනි 01 දිනැති අංක 34(i) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | සංස්ථා මණ්ඩල සේවකයන්ට අදාල දීමනා වැඩි කරන්නේ නම් එයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එයට පටහැනිව පහත පරිදි සංයුක්ත දිමනා ගෙවා තිබුණි. |

| චක්‍රලේඛ ප්‍රකාරව හිමි දීමනාව | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව ගෙවා තිබු දීමනාව |
|---|---|
| රු. | රු. |
| 350 | 700 |
| 400 | 800 |
| 500 | 1000 |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව,2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය බදුවලට පෙර රු.292,317,025 ක ශුද්ධ ලාභයක් වූ අතර එය ඉකුත් වර්ෂය සඳහා බදුවලට පෙර ශුද්ධ ලාභය වූ රු.151,827,962 සමඟ සැසඳීමේදී රු.140,489,063 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද භාණ්ඩාගාර බැඳුම්කර මත ලැබුණු රු.30,080,514 ක පොලී ආදායමද ඇතුළුව රු.30,752,598 ක් වූ මෙහෙයුම් නොවන ආදායම ගණන් ගැනීමට පෙර සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව රු.261,564,427 ක ශුද්ධ ලාභයක් ලබා තිබුණි. ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් නොවන ආදායම වූ රු.33,479,027 ගණන් ගැනීමට පෙර ශුද්ධ ලාභය රු.118,348,934 ක් වූයෙන් රු. 143,215,493 කින් ශුද්ධ ලාභය වර්ධනය වී තිබුණි. මේ වර්ධනයට හේතු වූයේ සමාලෝචිත වර්ෂයේ දළ ලාභය රු. 128,635,106 කින් වැඩිවීමත්, වෙනත් මෙහෙයුම් වියදම් රු. 20,982,203 කින් අඩුවීමත්ය.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 අලෙවි කටයුතු

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ඖෂධ පෙති හා කරල් අලෙවිය පහත පරිදි විය.

| | 2010 | | 2009 | |
|---|---|---|---|---|
| | ඒකක (මිලියන) | රු. (මිලියන) | ඒකක (මිලියන) | රු. (මිලියන) |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | 77.685 | 57.874 | 47.310 | 33.619 |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක | 967.262 | 868.828 | 601.149 | 732.138 |
| බෙදා හරින්නන් | 528.170 | 439.610 | 469.478 | 363.341 |
| නිර්යාත | 40.991 | 13.339 | 66.180 | 23.586 |
| | 1,614.108 | 1,379.652 | 1,184,117 | 1,152.684 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ඖෂධ අලෙවිය ඒකක 36.31% කින් වැඩි වී තිබුණි.

ii. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී, 2010 වර්ෂයේ අලෙවිය 19.69% කින් වැඩි වී තිබුණි. මුළු අලෙවියෙන් 62.97% ක ප්‍රමාණයක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට අලෙවි කර තිබුණි. තවද ඖෂධ 5 ක මිල 05% - 41% දක්වා මිල පරාසයක වැඩිවීම් සිදුකර තිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ නිර්යාත විකුණුම්වල අඩුවීමක් සිදුවී තිබුණි.

iv. ඖෂධ මිල නියම කිරීමේදී වෛද්‍ය සැපයුම් අංශයට නිකුත් කරනු ලබන ඖෂධ සඳහා වැඩි ප්‍රමුඛතාවයක් දී සහනදායී මිලකට ඖෂධ නිකුත් කළයුතු නමුදු සංස්ථාව විසින් විවිධ වට්ටම් සහන ලබා දෙමින් වෛද්‍ය සැපයුම් අංශයට වඩා අඩු මිලට බෙදාහරින්නන් සඳහා ඖෂධ අලෙවි කර තිබුණි.

v. 2009 මිල ගණන් හා 2010 මිල ගණන් යටතේ පැරසිටමෝල් ඖෂධය අලෙවියේදී පිළිවලින් 41% හා 36.04% ක ලාභ ආන්තිකයක්ද, මෙට්ෆෝමින් ඖෂධය සඳහා 2010 වර්ෂය සඳහා 21.2% වැඩි ලාභ ආන්තිකයක් සහිතව පෞද්ගලික අංශයට වඩා වැඩි මිලට වෛද්‍ය සැපයීම් අංශය සඳහා ඖෂධ අලෙවිකර තිබුණි.

vi. මිල කමිටුවේ අනුමැතය ඇතිව මුදල් ගෙවීමේ ප්‍රමාදය සැලකිල්ලට ගෙන 5%-10% ක පොලී ප්‍රතිශතයක්ද, ලාභ ආන්තිකය ලෙස 5% ක්ද එකතු කර වෛද්‍ය සැපයීම් අංශයට සපයන ඖෂධ සඳහා මිල නියම කර තිබුණි

vii. වෛද්‍ය සැපයුම් අංශය මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවට ලබාදී තිබූ ඇණවුම් වලින් 2009 වර්ෂය සඳහා ලැබී තිබූ ඒකක මිලි.571.50 කින් ඒකක මිලි.299.54 ක ප්‍රමාණයක්ද, 2010 වර්ෂය සඳහා ලැබී තිබූ ඒකක මිලි.885.8 කන් ඒකක මිලි. 528.587 ක ඇණවුම් ප්‍රමාණයක්ද තවදුරටත් සැපයීමට තිබුණි.

### 2.2.2 <u>නිෂ්පාදන කටයුතු</u>

2006 සිට 2010 දක්වා වූ කාල පරිච්ඡේදය තුල නිෂ්පාදන තත්තවයන් පහත දැක්වේ.

| වර්ෂය | නිෂ්පාදනය (ඒකක මිලියන) | ඉකුත් වර්ෂ සමඟ නිෂ්පාදනයේ විචලනය වෙනස්වීමේ ප්‍රතිශතය (%) | වැඩ මුර ගණන |
|---|---|---|---|
| 2006 | 752.93 | - | 01 |
| 2007 | 1,025.69 | 36.27 | 02 |
| 2008 | 1,032.55 | 0.66 | 02 |
| 2009 | 1,195.20 | 15.75 | 02 |
| 2010 | 1,614.11 | 35.04 | 02 |

ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනයේ 35.04% ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.3 <u>කාර්යසාධනය</u>

i. පහත සඳහන් පරිදි 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වාර්ෂිකව මුළු ඖෂධ වර්ග නිෂ්පාදනයන්ගේ වැඩිවීමක් පෙන්නුම් නොකෙරුණි.

| වර්ෂය | නිෂ්පාදන අංශයේ තොරතුරු අනුව නිෂ්පාදිත ඖෂධ වර්ග සංඛ්‍යාව |
|---|---|
| 2006 | 47 |
| 2007 | 43 |
| 2008 | 39 |
| 2009 | 38 |
| 2010 | 38 |

ii. <u>ISO 9000 - 2000 තත්ත්වය ලබාගැනීම</u>
සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සංස්ථාවට ISO තත්ත්වය ප්‍රදානය කර නොතිබුණි.

2.4 <u>හඳුනාගන්නා ලද පාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.353,862 ක් ව අමුද්‍රව්‍ය තොග කල් ඉකුත්වීම හේතුවෙන් ප්‍රතික්ෂේප වී තිබුණි.
(ආ) ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.157,685 ක් විය.
(ඇ) ප්‍රතික්ෂේපිත නිමි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.463,119 ක් විය.
(ඈ) ප්‍රතික්ෂේපිත කෙරිගෙන යන වැඩ තොගයේ වටිනාකම රු.481,299 ක් විය.

2.5 <u>ඵලදායි නොවන ගනුදෙනු</u>

රු.13,744,174 ක වියදමක් දරමින් සංස්ථාව තුල ස්ථාපනය කර ඇති Enterprises Resources Planning System පරිගණක මෘදුකාංගය මගින් සංස්ථාවේ තොග පාලනය හා සම්බන්ධ ගනුදෙනු නිසි ආකාරව ගණුම්ගත නොවන බව නිරීක්ෂණය විය.

2.6 <u>අයවැය පාලනය</u>

අයවැය සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩු පාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයා ගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

i. කල් ඉකුත් වූ ඖෂධ තොග
ii. වාහන උපයෝජනය
iii. ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය භාවිතය